# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2325/42 - 2023 මාර්තු මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2023.03.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

අතුරු ව්‍යවස්ථා

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වගන්තිය යටතේ කරනු ලබන නියමය**

මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර නීතිඥ ලලිත් යූ ගමගේ වන මා, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත සඳහන් වූ නියමය මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන බව නිවේදනය කරමි.

නීතිඥ, ලලිත් යූ. ගමගේ,
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

වර්ෂ 2023ක් වූ මාර්තු මස 16 වැනි දින,
මහනුවර,
මාලිගා චතුරස්‍රය,
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

*නියමය*

1. 2017 අංක 16 දරන සංශෝධිත පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ආඥාපනතේ (262 අධිකාරය) විධිවිධාන අනුව පත්කරනු ලබන ප්‍රාදේශීය සභාවක සාමාජික වන කාන්තා නියෝජනය, ප්‍රාදේශීය සභාවේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා ඵලදායී ලෙස දායක කර ගනිමින්; ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ ජීවත්වන කාන්තාවන්ගේ සුභසිද්ධිය හා සුභසාධනය නංවාලනුවස්, ප්‍රාදේශීය සභාව විසින් ඉටු කරනු ලබන කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමෙහිලා අනුගමනය කල යුතු

ක්‍රමෝපායන් පිළිබඳව ප්‍රාදේශීය සභා වෙත උපදෙස් ලබා දීම උදෙසා විධිවිධාන සලසාලනු පිණිස හා ඊට අවශ්‍ය විධාන සිදු කරනු පිණිස මෙම නියමය කරනු ලබයි.

2. ප්‍රාදේශීය සභාවන් විසින් සෑම මුදල් වර්ෂයක් සඳහා බල ප්‍රදේශවල ජීවත් වන කාන්තාවන්ගේ අභිවෘද්ධිය පිණිස ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් සම්බන්ධයෙන් සහ කාන්තාවන්ගේ සුභසිද්ධිය සහ සුභසාධනය සඳහා ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු ක්‍රමෝපායන් පිළිබඳව මෙම නියමය යටතේ නිශ්චිතව සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව වෙත උපදෙස් ලබා දීම සඳහා කාන්තා කටයුතු සම්බන්ධයෙන් වන විශේෂ උපදේශක කාරක සභාවක් මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභා විසින් කලින් කල පත්කර ගැනීම සඳහා ක්‍රියා කළ යුතුය.

3. මෙම නියමය යටතේ පත්වන උපදේශක කාරක සභාවක් විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව වෙත උපදෙස් ලබා දීම සිදු කළ යුතුය.

(1) කාන්තා ශ්‍රමය බල ප්‍රදේශයෙහි සංවර්ධනය සහ සමාජ සුභ සාධනය සඳහා යෙදවීමට හැකි වන පරිදි කාන්තා අභිවෘද්ධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළව

(2) කාන්තාවන් වෙනුවෙන් දැනුම, ආකල්ප හා කුසලතා, වර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළව

(3) ප්‍රාදේශීය සභාබල ප්‍රදේශ තුළ ජීවත්වන කාන්තාවන්ගේ ආරක්ෂාව හා අපචාර වැළැක්වීම සඳහා ප්‍රාදේශීය සභා මට්ටමින් ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් හා උපායමාර්ග පිළිබඳව

(4) කාන්තාවන්ගේ ආර්ථිකය නගා සිටුවීම සඳහා ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන් හඳුන්වා දීම හා ණය යෝජනා ක්‍රම හඳුන්වා දීම, පිළිබඳව

(5) බල ප්‍රදේශ තුළ ගෙවතු වගා වැඩසටහන් ඇතුළු හරිත කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා සහාය ලබා දීම, පිළිබඳව

(6) බල ප්‍රදේශය තුළ ජීවත්වන කාන්තාවන්ගේ අදහස් හුවමාරු කර ගැනීම සඳහා අවශ්‍ය සංවාද මණ්ඩපයක් ඇති කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව

(7) කාන්තාවන්ගේ ආවේණික හැකියාවන් සහ කුසලතාවයන් මෙන්ම පාරම්පරික කර්මාන්ත දියුණු කර ගැනීමට අවශ්‍ය සහාය ලබා දීම සහ ඊට අදාළ නිෂ්පාදන සඳහා වෙළඳපොළ හඳුන්වා දීම, පිළිබඳව

4. මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභාවක සංයුතිය; එම ප්‍රාදේශීය සභාව නියෝජනය කරන කාන්තා සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක සංඛ්‍යාවකට සමාන අගයක් විය යුතු අතර එය ප්‍රාදේශීය සභාවෙහි කාන්තා නියෝජිතවරියන් ගෙන් සමන්විත විය යුතුය.එසේ වුවද ප්‍රාදේශීය සභාවේ සභාපති කාන්තා නියෝජනයක් වන විටදී, එම සභාපතිනිය නිල බලයෙන් කාරක සභාවේ සාමාජිකයෙකු විය යුතුය.

5. මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභා සාමාජිකයින් අතරින් එක් අයෙකු, කාරක සභා සාමාජිකයින්ගේ බහුතර කැමැත්තෙන් කාරක සභා සභාපති වශයෙන් පත්කර ගත යුතුය. එසේ වුවද ප්‍රාදේශීය සභාවේ සභාපති කාන්තා නියෝජනයක් වන විටදී, එම සභාපතිනිය නිල බලයෙන් කාරක සභාවේ සභාපති විය යුතුය.

6. මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභා රැස්වීමක කාරක සභාව වශයෙන් එකඟ වන කරුණු, මෙම නියමය යටතේ පැවැත්වෙන උපදේශක කාරක සභා රැස්වීමේදී පැමිණ ඡන්දය දෙන බහුතරය විසින් එකඟ වන කරුණු විය යුතුය.

7. මෙම නියමය යටතේ රැස්වන රැස්වීමක් ඉදිරියේ ඇති කරුණු සම්බන්ධයෙන් ඡන්දය පක්ෂව හෝ විපක්ෂව සමාන ලෙස බෙදී ඇති අවස්ථාවක එම රැස්වීමේ මූලාසනය දරන සාමාජිකයා වෙත අතිරේක තීරක ඡන්දයක් හිමි විය යුතුය.

8. මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභාවක සභා රැස්වීමක සන පූර්ණය එදිනට එහි සාමාජිකත්වය දරණ සංඛ්‍යාවෙන් තුනෙන් එක් පංගුවකට සමාන සාමාජිකයින් විය යුතු අතර කාරක සභා රැස්වීමක නියමිත සන පූර්ණය ඇත්තේ නම් මිස කිසිම කටයුත්තක් අදාළ රැස්වීමේදී නොකළ යුතුය.

9. ප්‍රාදේශීය සභාවේ ලේකම් නිල බලයෙන් මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභාවේ ලේකම් විය යුතුය.

10. මෙම නියමය යටතේ පත්කර ගන්නා ලද විශේෂ උපදේශක කාරක සභා රැස්වීමක් සම්බන්ධව;

(1) සෑම ලිත් මාසයක් වෙනුවෙන්ම අවම වශයෙන් එක් වරක්වත් රැස්විය යුතු අතර කාරක සභාව තීරණය කරන පරිදි එය සතියේ කවර හෝ දිනයක රැස්විය හැකිය.

(2) රැස්වීම පැවැත්විය යුතු දිනය කාරක සභාවේ බහුතරයක් සාමාජිකයන් එකඟ වන පරිදි විශේෂ උපදේශක කාරක සභාවේ සභාපතිවරයා විසින් තීරණය කළ යුතුය.

(3) රැස්වීම් කැඳවීම පිළිබඳ දැන්වීමක් කාරක සභාවේ සභාපති විසින් රැස්වීම පැවැත්වීමට දින තුනකට කලින් කාරක සභාවේ සියලුම සාමාජිකයින් වෙත භාර දිය යුතු අතර භාරදීම යන්නට පදිංචි ලිපිනයෙහි තැබීම අදහස් වෙයි.

(4) රැස්වීමේ දැන්වීම සමඟ එදිනට අදාළ න්‍යාය පත්‍රය භාර දිය යුතු අතර න්‍යාය පත්‍රයෙහි සඳහන් ආකාරයට එදිනට අදාළ කාර්යයන් ඉටු කළ යුතුය.

(5) රැස්වීම ඉදිරියේ ඇති කරුණක් සම්බන්ධව කිසියම් සභිකයෙකුට බහුතරයකගේ මතයට එකඟ නොවීමට හේතුවන කරුණු ඇත්නම් එය ලිඛිතව වුව ද ඉදිරිපත් කළ හැකි අතර, එසේ ලිඛිතව කරුණු ඉදිරිපත් කරයි නම්, එම ලිඛිත ප්‍රකාශය එදිනට අදාළ කාරක සභා වාර්තාවේම කොටසක් වශයෙන් සැලකිය යුතුය.

(6) සභාව විසින් මෙම කාරක සභාව වෙත ඉදිරිපත් කළ යුතු යැයි තීරණය කරන කවර හෝ කරුණක් මෙන්ම කාරක සභාවේ සාමාජිකයෙකු වන සභිකවරයෙකු හෝ සභාවේ වෙනත් ඕනෑම සභිකයෙකු විසින් හෝ කාරක සභාවේ සලකා බැලීම සඳහා මෙම නියමයෙහි අරමුණට අදාළ වන්නා වූ යම් යෝජනාවක්, ප්‍රශ්නයක් ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර එසේ ඉදිරිපත් වන ලිඛිත නියෝජනය රැස්වීමට දින තුනකට කලින් ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

(7) කාරක සභාව ඉදිරියේ ඇති කරුණක් සම්බන්ධව ඡන්දයක් විමසන අවස්ථාවේ කාරක සභාවට පැමිණ සිටින සියලුම සාමාජිකයින් ඡන්දය ප්‍රකාශ කිරීමේ වගකීමකට යටත් විය යුතුය.

(8) කාරක සභා වාර්තාව කාරක සභාවට පැමිණි සාමාජිකයන් අත්සන් කර අනුමත කිරීමෙන් පසු එම වාර්තාවේ සහතික පිටපත් සියලුම කාරක සභා සාමාජිකයින් වෙත බෙදා හැරිය යුතුය.

11. මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභා රැස්වීමකට අදාළ කටයුතු හා ක්‍රියා, කාරක සභාවේ ලේකම් විසින් වාර්තා කළ යුතු අතර අදාළ වාර්තාවට කාරක සභාවට එදින පැමිණි සාමාජිකයින් සියලු දෙනා අත්සන් තබා එය අනුමත කර ගත යුතුය. එසේ කාරක සභා රැස්වීමක වාර්තාව අනුමත කිරීමෙන් පසු අදාළ වාර්තාවේ කාරක සභාවේ ලේකම් විසින් සහතික කරන ලද පිටපතක් කාරක සභාවේ සෑම සාමාජිකයෙකු වෙතම භාර දිය යුතුය.

12.මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක සභාවක් විසින් සලකා බලන ලද ලේඛන කාරක සභා වාර්තා, කාරක සභාවේ ලේකම් විසින් සුරක්ෂිතව පවත්වා ගත යුතුය.

13. (1) මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභාවක පත්කළ සාමාජිකයෙකු අනුගාමී කාරක සභා රැස්වීම් වාර තුනක් සඳහා කාරක සභාවේ අවසරයකින් තොරව නොපැමිණියේ නම් එම කාරක සභා සාමාජිකයාගේ විශේෂ උපදේශක කාරක සභා සාමාජිකත්වය එනයින්ම අවසන් වන්නේය.

(2) කාරක සභාවේ ඇතිවන පුරප්පාඩුවක් සඳහා වෙනත් සාමාජිකයෙකු පත්කළ යුතු අතර එසේ පත් කිරීමේ දී මෙම නියමය යටතේ සඳහන් සංයුතිය අදාළ විය යුතුය.

(3) කාරක සභාවක හිස් වූ පුරප්පාඩුවක් සඳහා සාමාජිකයෙකු පත්කිරීමේ දී, එසේ පත්කරන ලද සාමාජිකයාගේ ධූර කාලය,- එම කාරක සභාවට අදාළ ධූරය හිස් වූ සාමාජිකයාගේ ඉතිරි ධූර කාලය විය යුතුය.

14. මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභාවක් විසින්,

(1) කාරක සභාව ඉදිරියේ ඇති කරුණක් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවෙහි කිසියම් සභිකයෙකු හෝ නිලධාරියෙකු විසින් තම අදහස් ඉදිරිපත් කිරීම යථායෝග්‍ය යැයි අදහස් කරන කවර අවස්ථාවක හෝ ඊට අදාළව අදහස් ලිඛිතව හෝ වාචිකව කාරක සභාව අදහස් කරන පරිදි ඉදිරිපත් කළ හැකිය.

(2) කාරක සභාව ඉදිරියේ ඇති කරුණක් සම්බන්ධයෙන් මහජන අදහස් විමසීම උචිත යැයි කාරක සභාව අදහස් කරයි නම්, කරුණට අදාළව අවසන් උපදෙස් මහ සභාවට ඉදිරිපත් කිරීමට පූර්වයෙන් කාරක සභාව විසින් මහජන අදහස් විමසීම සඳහා ක්‍රියා කළ හැකිය.

15. සෑම මසකම මෙම නියම යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභා යටතේ සලකා බලන ලදුව ප්‍රාදේශීය සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන නිර්දේශයන්ට අදාළ යෝජනා, එම කාරක සභාවේ සභාපති විසින් අනුගාමී මාසයේ සාමාන්‍ය මහා සභා රැස්වීමට ප්‍රාදේශිය සභාවේ තීරණය සඳහා යෝජනා කළ යුතුය.

16. කාරක සභාවක කටයුතු සිංහලෙන් හෝ දෙමළ භාෂාවෙන් විය යුතු අතර, කටයුතු සිදුවන භාෂාවට අනුකූලව වාර්තාව පිළියෙල කළ යුතුය.සිංහල මාධ්‍යයෙන් පිළියෙල කරන ලද කාරක සභා වාර්තාවක් දෙමළ මාධ්‍යයෙන් ද, දෙමළ මාධ්‍යයෙන් පිළියෙල කරන වාර්තාවක් සිංහල මාධ්‍යයෙන් ද, කවර පාර්ශවයකට ලබා ගැනීමේ අයිතිය ඇත්තේය.

17. මෙම නියමයෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා අතර, අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

EOG 03 - 0364/1

---

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

අතුරු ව්‍යවස්ථා

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 247 වගන්තිය යටතේ කරනු ලබන නියමය**

මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර නීතිඥ ලලිත් යූගමගේ වන මා, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 247 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත සඳහන් වූ නියමය මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන බව නිවේදනය කරමි.

**නීතිඥ, ලලිත් යූ. ගමගේ,**
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

වර්ෂ 2023ක් වූ මාර්තු මස 16 වැනි දින,
මහනුවර,
මාලිගා චතුරස්‍රය,
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

***නියමය***

1. 2017 අංක 16 දරන සංශෝධිත පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ආඥාපනතේ (262 අධිකාරය) විධිවිධාන අනුව පත්කරනු ලබන නගර සභාවක සාමාජික කාන්තා නියෝජනය,නගර සභාවේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා ඵලදායී ලෙස දායක කර ගනිමින්; නගර සභා බල ප්‍රදේශ තුළ ජීවත්වන කාන්තාවන්ගේ සුභ සිද්ධිය හා සුභසාධනය නංවාලනුවස්, නගර සභාව විසින් ඉටු කරනු ලබන කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමෙහිලා අනුගමනය කල යුතු ක්‍රමෝපායන් පිළිබඳව නගර සභා වෙත උපදෙස් ලබා දීම උදෙසා විධිවිධාන සලසාලනු පිණිස හා ඊට අවශ්‍ය විධාන සිදු කරනු පිණිස මෙම නියමය කරනු ලබයි.

2 නගර සභාවක් විසින් සෑම මුදල් වර්ෂයක් සඳහා බල ප්‍රදේශවල ජීවත් වන කාන්තාවන්ගේ අභිවෘද්ධිය පිණිස ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් සම්බන්ධයෙන් සහ කාන්තාවන්ගේ සුභසිද්ධිය සහ සුභ සාධනය සඳහා නගර සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු ක්‍රමෝපායන් පිළිබඳව මෙම නියමය යටතේ නිශ්චිතව සඳහන් කරුණු සම්බන්ධයෙන් නගර සභාව වෙත උපදෙස් ලබා දීම සඳහා කාන්තා කටයුතු සම්බන්ධයෙන් වන විශේෂ උපදේශක කාරක සභාවක් මධ්‍යම පළාතේ නගර සභා විසින් කලින් කල පත්කර ගැනීම සඳහා ක්‍රියා කළ යුතුය.

3. මෙම නියමය යටතේ පත්වන උපදේශක කාරක සභාවක් විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නගර සභාව වෙත උපදෙස් ලබා දීම සිදු කළ යුතුය.

(1) කාන්තා ශ්‍රමය බල ප්‍රදේශයෙහි සංවර්ධනය සහ සමාජ සුභ සාධනය සඳහා යෙදවීමට හැකි වන පරිදි කාන්තා අභිවෘද්ධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළව

(2) කාන්තාවන් වෙනුවෙන් දැනුම, ආකල්ප හා කුසලතා, වර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළව

(3) නගර සභාබල ප්‍රදේශ තුළ ජීවත්වන කාන්තාවන්ගේ ආරක්ෂාව හා අපචාර වැළැක්වීම සඳහා නගර සභා මට්ටමින් ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් හා උපායමාර්ග පිළිබඳව

(4) කාන්තාවන්ගේ ආර්ථිකය නඟා සිටුවීම සඳහා ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන් හඳුන්වා දීම හා ණය යෝජනා ක්‍රම හඳුන්වා දීම, පිළිබඳව

(5) බල ප්‍රදේශ තුළ ගෙවතු වගා වැඩසටහන් ඇතුළු හරිත කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා සහාය ලබා දීම, පිළිබඳව

(6) බල ප්‍රදේශය තුළ ජීවත්වන කාන්තාවන්ගේ අදහස් හුවමාරු කර ගැනීම සඳහා අවශ්‍ය සංවාද මණ්ඩපයක් ඇති කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව

(7) කාන්තාවන්ගේ ආවේණික හැකියාවන් සහ කුසලතාවයන් මෙන්ම පාරම්පරික කර්මාන්ත දියුණු කර ගැනීමට අවශ්‍ය සහාය ලබා දීම සහ ඊට අදාළ නිෂ්පාදන සඳහා වෙළඳපොළ හඳුන්වා දීම, පිළිබඳව

4. මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභාවක සංයුතිය; එම නගර සභාව නියෝජනය කරන කාන්තා සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක සංඛ්‍යාවකට සමාන අගයක් විය යුතු අතර එය නගර සභාවෙහි කාන්තා නියෝජිතවරියන් ගෙන් සමන්විත විය යුතුය. එසේ වුවද නගර සභාවේ සභාපති කාන්තා නියෝජනයක් වන විටදී, එම සභාපතිනිය නිල බලයෙන් කාරක සභාවේ සාමාජිකයෙකු විය යුතුය.

5. මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභා සාමාජිකයින් අතරින් එක් අයෙකු, කාරක සභා සාමාජිකයින්ගේ බහුතර කැමැත්තෙන් කාරක සභා සභාපති වශයෙන් පත්කර ගත යුතුය. එසේ වුවද නගර සභාවේ සභාපති කාන්තා නියෝජනයක් වන විටදී, එම සභාපතිනිය නිලබලයෙන් කාරක සභාවේ සභාපති විය යුතුය.

6. මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභා රැස්වීමක කාරක සභාව වශයෙන් එකඟවන කරුණු, මෙම නියමය යටතේ පැවැත්වෙන උපදේශක කාරක සභා රැස්වීමේදී පැමිණ ඡන්දය දෙන බහුතරය විසින් එකඟ වන කරුණු විය යුතුය.

7. මෙම නියමය යටතේ රැස්වන රැස්වීමක් ඉදිරියේ ඇති කරුණු සම්බන්ධයෙන් ඡන්දය පක්ෂව හෝ විපක්ෂව සමාන ලෙස බෙදී ඇති අවස්ථාවක එම රැස්වීමේ මූලාසනය දරන සාමාජිකයා වෙත අතිරේක තීරක ඡන්දයක් හිමි විය යුතුය.

8. මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභාවක සභා රැස්වීමක සන පූර්ණය එදිනට එහි සාමාජිකත්වය දරන සංඛ්‍යාවෙන් තුනෙන් එක් පංගුවකට සමාන සාමාජිකයින් විය යුතු අතර කාරක සභා රැස්වීමක නියමිත සන පූර්ණය ඇත්තේ නම් මිස කිසිම කටයුත්තක් අදාළ රැස්වීමේදී නොකළ යුතුය.

9. නගර සභාවේ ලේකම් නිල බලයෙන් මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභාවේ ලේකම් විය යුතුය.

10. මෙම නියමය යටතේ පත්කර ගන්නා ලද විශේෂ උපදේශක කාරක සභා රැස්වීමක් සම්බන්ධව;

(1) සෑම ලිත් මාසයක් වෙනුවෙන්ම අවම වශයෙන් එක් වරක්වත් රැස්විය යුතු අතර කාරක සභාව තීරණය කරන පරිදි එය සතියේ කවර හෝ දිනයක රැස්විය හැකිය.

(2) රැස්වීම පැවැත්විය යුතු දිනය කාරක සභාවේ බහුතරයක් සාමාජිකයන් එකඟ වන පරිදි විශේෂ උපදේශක කාරක සභාවේ සභාපතිවරයා විසින් තීරණය කළ යුතුය.

(3) රැස්වීම් කැඳවීම පිළිබඳ දැන්වීමක් කාරක සභාවේ සභාපති විසින් රැස්වීම පැවැත්වීමට දින තුනකට කලින් කාරක සභාවේ සියලුම සාමාජිකයින් වෙත භාර දිය යුතු අතර භාරදීම යන්නට පදිංචි ලිපිනයෙහි තැබීම අදහස් වෙයි.

(4) රැස්වීමේ දැන්වීම සමග එදිනට අදාළ න්‍යාය පත්‍රය භාර දිය යුතු අතර න්‍යාය පත්‍රයෙහි සඳහන් ආකාරයට එදිනට අදාළ කාර්යයන් ඉටු කළ යුතුය.

(5) රැස්වීම ඉදිරියේ ඇති කරුණක් සම්බන්ධව කිසියම් සභිකයෙකුට බහුතරයකගේ මතයට එකඟ නොවීමට හේතුවන කරුණු ඇත්නම් එය ලිඛිතව වුව ද ඉදිරිපත් කළ හැකි අතර, එසේ ලිඛිතව කරුණු ඉදිරිපත් කරයි නම්, එම ලිඛිත ප්‍රකාශය එදිනට අදාළ කාරක සභා වාර්තාවේම කොටසක් වශයෙන් සැලකිය යුතුය.

(6) සභාව විසින් මෙම කාරක සභාව වෙත ඉදිරිපත් කළ යුතු යැයි තීරණය කරන කවර හෝ කරුණක් මෙන්ම කාරක සභාවේ සාමාජිකයෙකු වන සභිකවරයෙකු හෝ සභාවේ වෙනත් ඕනෑම සභිකයෙකු විසින් හෝ කාරක සභාවේ සලකා බැලීම සඳහා මෙම නියමයෙහි අරමුණට අදාළ වන්නා වූ යම් යෝජනාවක්, ප්‍රශ්නයක් ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර එසේ ඉදිරිපත් වන ලිඛිත නියෝජනය රැස්වීමට දින තුනකට කලින් ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

(7) කාරක සභාව ඉදිරියේ ඇති කරුණක් සම්බන්ධව ඡන්දයක් විමසන අවස්ථාවේ කාරක සභාවට පැමිණ සිටින සියලුම සාමාජිකයින් ඡන්දය ප්‍රකාශ කිරීමේ වගකීමකට යටත් විය යුතුය.

(8) කාරක සභා වාර්තාව කාරක සභාවට පැමිණි සාමාජිකයන් අත්සන් කර අනුමත කිරීමෙන් පසු එම වාර්තාවේ සහතික පිටපත් සියලුම කාරක සභා සාමාජිකයින් වෙත බෙදා හැරිය යුතුය.

11. මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභා රැස්වීමකට අදාළ කටයුතු හා ක්‍රියා, කාරක සභාවේ ලේකම් විසින් වාර්තා කළ යුතු අතර අදාළ වාර්තාවට කාරක සභාවට එදින පැමිණි සාමාජිකයින් සියලු දෙනා අත්සන් තබා එය අනුමත කර ගත යුතුය. එසේ කාරක සභා රැස්වීමක වාර්තාව අනුමත කිරීමෙන් පසු අදාළ වාර්තාවේ කාරක සභාවේ ලේකම් විසින් සහතික කරන ලද පිටපතක් කාරක සභාවේ සෑම සාමාජිකයෙකු වෙතම භාර දිය යුතුය.

12. මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක සභාවක් විසින් සලකා බලන ලද ලේඛන කාරක සභා වාර්තා, කාරක සභාවේ ලේකම් විසින් සුරක්ෂිතව පවත්වා ගත යුතුය.

13. (1) මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභාවක පත්කළ සාමාජිකයෙකු අනුගාමී කාරක සභා රැස්වීම් වාර තුනක් සඳහා කාරක සභාවේ අවසරයකින් තොරව නොපැමිණියේ නම් එම කාරක සභා සාමාජිකයාගේ විශේෂ උපදේශක කාරක සභා සාමාජිකත්වය එනයින්ම අවසන් වන්නේය.

(2) කාරක සභාවේ ඇතිවන පුරප්පාඩුවක් සඳහා වෙනත් සාමාජිකයෙකු පත්කළ යුතු අතර එසේ පත් කිරීමේ දී මෙම නියමය යටතේ සඳහන් සංයුතිය අදාළ විය යුතුය.

(3) කාරක සභාවක හිස් වූ පුරප්පාඩුවක් සඳහා සාමාජිකයෙකු පත්කිරීමේ දී, එසේ පත්කරන ලද සාමාජිකයාගේ ධූර කාලය, එම කාරක සභාවට අදාළ ධූරය හිස් වූ සාමාජිකයාගේ ඉතිරි ධූර කාලය විය යුතුය.

14. මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභාවක් විසින්,

(1) කාරක සභාව ඉදිරියේ ඇති කරුණක් සම්බන්ධයෙන් නගර සභාවෙහි කිසියම් සභිකයෙකු හෝ නිලධාරියෙකු විසින් තම අදහස් ඉදිරිපත් කිරීම යථායෝග්‍ය යැයි අදහස් කරන කවර අවස්ථාවක හෝ ඊට අදාළව අදහස් ලිඛිතව හෝ වාචිකව කාරක සභාව අදහස් කරන පරිදි ඉදිරිපත් කළ හැකිය.

(2) කාරක සභාව ඉදිරියේ ඇති කරුණක් සම්බන්ධයෙන් මහජන අදහස් විමසීම උචිත යැයි කාරක සභාව අදහස් කරයි නම්, කරුණට අදාළව අවසන් උපදෙස් මහ සභාවට ඉදිරිපත් කිරීමට පූර්වයෙන් කාරක සභාව විසින් මහජන අදහස් විමසීම සඳහා ක්‍රියා කළ හැකිය.

15. සෑම මසකම මෙම නියම යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභා යටතේ සලකා බලන ලදුව නගර සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන නිර්දේශයන්ට අදාළ යෝජනා, එම කාරක සභාවේ සභාපති විසින් අනුගාමී මාසයේ සාමාන්‍ය මහා සභා රැස්වීමට හෝ විශේෂ මහා සභා රැස්වීමකට නගර සභාවට තීරණය කිරීම සඳහා යෝජනා කළ යුතුය.

16. කාරක සභාවක කටයුතු සිංහලෙන් හෝ දෙමළ භාෂාවෙන් විය යුතු අතර, කටයුතු සිදුවන භාෂාවට අනුකූලව වාර්තාව පිළියෙල කළ යුතුය. සිංහල මාධ්‍යයෙන් පිළියෙල කරන ලද කාරක සභා වාර්තාවක් දෙමළ මාධ්‍යයෙන් ද, දෙමළ මාධ්‍යයෙන් පිළියෙල කරන වාර්තාවක් සිංහල මාධ්‍යයෙන් ද, කවර පාර්ශවයකට ලබා ගැනීමේ අයිතිය ඇත්තේය.

17. මෙම නියමයෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා අතර, අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

EOG 03 - 0364/2

---

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

අතුරු ව්‍යවස්ථා

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා අඥාපනතේ 326 වගන්තිය යටතේ කරනු ලබන නියමය**

මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර නීතිඥ ලලිත් යූ ගමගේ වන මා, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා අඥාපනතේ 326 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත සඳහන් වූ නියමය මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන බව නිවේදනය කරමි.

**නීතිඥ, ලලිත් යූ. ගමගේ,**
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

වර්ෂ 2023ක් වූ මාර්තු මස 16 වැනි දින,
මහනුවර,
මාලිගා චතුරස්‍රය,
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

***නියමය***

1. 2017 අංක 16 දරන සංශෝධිත පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ආඥාපනතේ (262 අධිකාරය) විධිවිධාන අනුව පත් කරනු ලබන මහා නගර සභාවක සාමාජික කාන්තා නියෝජනය, මහා නගර සභාවේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා ඵලදායී ලෙස දායක කර ගනිමින්; මහා නගර සභා බල ප්‍රදේශ තුළ ජීවත්වන කාන්තාවන්ගේ සුභසිද්ධිය හා සුභසාධනය නංවාලනුවස්, මහා නගර සභාව විසින් ඉටු කරනු ලබන කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමෙහිලා අනුගමනය කල යුතු ක්‍රමෝපායන් පිළිබඳව මහා නගර සභා වෙත උපදෙස් ලබා දීම උදෙසා විධිවිධාන සලසාලනු පිණිස හා ඊට අවශ්‍ය විධාන සිදු කරනු පිණිස මෙම නියමය කරනු ලබයි.

2. මහා නගර සභාවක් විසින් කලින් කල බල ප්‍රදේශවල ජීවත් වන කාන්තාවන්ගේ අභිවෘද්ධිය පිණිස ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් සම්බන්ධයෙන් සහ කාන්තාවන්ගේ ආරක්ෂාව, සුභසිද්ධිය සහ සුභසාධනය සඳහා මහා නගර සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු ක්‍රමෝපායන් පිළිබඳව මෙම නියමය යටතේ නිශ්චිතව සඳහන් කරුණු සම්බන්ධයෙන් මහා නගර සභාව වෙත උපදෙස් ලබා දීම සඳහා කාන්තා කටයුතු සම්බන්ධයෙන් වන විශේෂ උපදේශක කාරක සභාවක් මධ්‍යම පළාතේ මහා නගර සභා විසින් කලින් කල පත්කර ගැනීම සඳහා ක්‍රියා කළ යුතුය.

3. මෙම නියමය යටතේ පත්වන උපදේශක කාරක සභාවක් විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් මහා නගර සභා වෙත උපදෙස් ලබා දීම සිදු කළ යුතුය.

(1) කාන්තා ශ්‍රමය බල ප්‍රදේශයෙහි සංවර්ධනය සහ සමාජ සුභ සාධනය සඳහා යෙදවීමට හැකි වන පරිදි කාන්තා අභිවෘද්ධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළව

(2) කාන්තාවන් වෙනුවෙන් දැනුම, ආකල්ප හා කුසලතා, වර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළව

(3) මහා නගර සභාබල ප්‍රදේශ තුළ ජීවත්වන කාන්තාවන්ගේ ආරක්ෂාව හා අපචාර වැළැක්වීම සඳහා මහා නගර සභා මට්ටමින් ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් හා උපායමාර්ග පිළිබඳව

(4) කාන්තාවන්ගේ ආර්ථිකය නගා සිටුවීම සඳහා ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන් හඳුන්වා දීම හා ණය යෝජනා ක්‍රම හඳුන්වා දීම, පිළිබඳව

(5) බල ප්‍රදේශ තුළ ගෙවතු වගා වැඩසටහන් ඇතුළු හරිත කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා සහාය ලබා දීම, පිළිබඳව

(6) බල ප්‍රදේශය තුළ ජීවත්වන කාන්තාවන්ගේ අදහස් හුවමාරු කර ගැනීම සඳහා අවශ්‍ය සංවාද මණ්ඩපයක් ඇති කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව

(7) කාන්තාවන්ගේ ආවේණික හැකියාවන් සහ කුසලතාවයන් මෙන්ම පාරම්පරික කර්මාන්ත දියුණු කර ගැනීමට අවශ්‍ය සහාය ලබා දීම සහ ඊට අදාළ නිෂ්පාදන සඳහා වෙළඳපොළ හඳුන්වා දීම, පිළිබඳව

4. මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභාවක සංයුතිය; එම මහා නගර සභාව නියෝජනය කරන කාන්තා සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක සංඛ්‍යාවකට සමාන අගයක් විය යුතු අතර එය මහා නගර සභාවෙහි කාන්තා නියෝජිතවරියන්ගෙන් සමන්විත විය යුතුය. එසේ වුවද මහා නගර සභාවේ නගරාධිපති කාන්තා නියෝජනයක් වන විටදී එම නගරාධිපතිනිය නිල බලයෙන්ම කමිටුවේ සාමාජිකයෙකු විය යුතුය.

5. මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභා සාමාජිකයින් අතරින් එක් අයෙකු, කාරක සභා සාමාජිකයින්ගේ බහුතර කැමැත්තෙන් කාරක සභා සභාපති වශයෙන් පත්කර ගත යුතුය. එසේ වුවද මහා නගර සභාවේ නගරාධිපති කාන්තා නියෝජනයක් වන විටදී, එම නගරාධිපතිනිය නිල බලයෙන් කාරක සභාවේ සභාපති විය යුතුය.

6. මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභා රැස්වීමක කාරක සභාව වශයෙන් එකඟ වන කරුණු, මෙම නියමය යටතේ පැවැත්වෙන උපදේශක කාරක සභා රැස්වීමේදී පැමිණ ඡන්දය දෙන බහුතරය විසින් එකඟ වන කරුණු විය යුතුය.

7.මෙම නියමය යටතේ රැස්වන රැස්වීමක් ඉදිරියේ ඇති කරුණු සම්බන්ධයෙන් ඡන්දය පක්ෂව හෝ විපක්ෂව සමාන ලෙස බෙදී ඇති අවස්ථාවක එම රැස්වීමේ මූලාසනය දරන සාමාජිකයා වෙත අතිරේක තීරක ඡන්දයක් හිමි විය යුතුය.

8. මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභාවක සභා රැස්වීමක සන පූර්ණය එදිනටඑහි සාමාජිකත්වය දරණ සංඛ්‍යාවෙන් තුනෙන් එක් පංගුවකට සමාන සාමාජිකයින් විය යුතු අතර කමිටු රැස්වීමක නියමිත සන පූර්ණය ඇත්තේ නම් මිස කිසිම කටයුත්තක් අදාළ රැස්වීමේදී නොකළ යුතුය.

9. මහා නගර සභාවේ ලේකම් නිල බලයෙන් මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශකකාරක සභාවේ ලේකම් විය යුතුය.

10. මෙම නියමය යටතේ පත්කර ගන්නා ලද විශේෂ උපදේශක කාරක සභා රැස්වීමක් සම්බන්ධව;

(1) සෑම ලිත් මාසයක් වෙනුවෙන්ම අවම වශයෙන් එක් වරක්වත් රැස්විය යුතු අතර කාරක සභාව තීරණය කරන පරිදි එය සතියේ කවර හෝ දිනයක රැස්විය හැකිය.

(2) රැස්වීම පැවැත්විය යුතු දිනය කාරක සභාවේ බහුතරයක් සාමාජිකයන් එකඟ වන පරිදි විශේෂ උපදේශක කාරක සභාවේ සභාපතිවරයා විසින් තීරණය කළ යුතුය.

(3) රැස්වීම් කැඳවීම පිළිබඳ දැන්වීමක් කාරක සභාවේ සභාපති විසින් රැස්වීම පැවැත්වීමට දින තුනකට කලින් කාරක සභාවේ සියලුම සාමාජිකයින් වෙත භාර දිය යුතු අතර භාරදීම යන්නට පදිංචි ලිපිනයෙහි තැබීම අදහස් වෙයි.

(4) රැස්වීමේ දැන්වීම සමඟ එදිනට අදාළ න්‍යාය පත්‍රය භාර දිය යුතු අතර න්‍යාය පත්‍රයෙහි සඳහන් ආකාරයට එදිනට අදාළ කාර්යයන් ඉටු කළ යුතුය.

(5) රැස්වීම ඉදිරියේ ඇති කරුණක් සම්බන්ධව කිසියම් සභිකයෙකුට බහුතරයකගේ මතයට එකඟ නොවීමට හේතුවන කරුණු ඇත්නම් එය ලිඛිතව වුව ද ඉදිරිපත් කළ හැකි අතර, එසේ ලිඛිතව කරුණු ඉදිරිපත් කරයි නම්, එම ලිඛිත ප්‍රකාශය එදිනට අදාළ කාරක සභා වාර්තාවේම කොටසක් වශයෙන් සැලකිය යුතුය.

(6) සභාව විසින් මෙම කාරක සභාව වෙත ඉදිරිපත් කළ යුතු යැයි තීරණය කරන කවර හෝ කරුණක් මෙන්ම කාරක සභාවේ සාමාජිකයෙකු වන සභිකවරයෙකු හෝ සභාවේ වෙනත් ඕනෑම සභිකයෙකු විසින් හෝ කාරක සභාවේ සලකා බැලීම සඳහා මෙම නියමයෙහි අරමුණට අදාළ වන්නා වූ යම් යෝජනාවක්, ප්‍රශ්නයක් ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර එසේ ඉදිරිපත් වන ලිඛිත නියෝජනය රැස්වීමට දින තුනකට කලින් ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

(7) කාරක සභාව ඉදිරියේ ඇති කරුණක් සම්බන්ධව ඡන්දයක් විමසන අවස්ථාවේ කාරක සභාවට පැමිණ සිටින සියලුම සාමාජිකයින් ඡන්දය ප්‍රකාශ කිරීමේ වගකීමකට යටත් විය යුතුය.

(8) කාරක සභා වාර්තාව කාරක සභාවට පැමිණි සාමාජිකයන් අත්සන් කර අනුමත කිරීමෙන් පසු එම වාර්තාවේ සහතික පිටපත් සියලුම කාරක සභා සාමාජිකයින් වෙත බෙදා හැරිය යුතුය.

11. මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභා රැස්වීමකට අදාළ කටයුතු හා ක්‍රියා, කාරක සභාවේ ලේකම් විසින් වාර්තා කළ යුතු අතර අදාළ වාර්තාවට කාරක සභාවට එදින පැමිණි සාමාජිකයින් සියලු දෙනා අත්සන් තබා එය අනුමත කර ගත යුතුය. එසේ කාරක සභා රැස්වීමක වාර්තාව අනුමත කිරීමෙන් පසු අදාළ වාර්තාවේ කාරක සභාවේ ලේකම් විසින් සහතික කරන ලද පිටපතක් කාරක සභාවේ සෑම සාමාජිකයෙකු වෙතම භාර දිය යුතුය.

12. මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක සභාවක් විසින් සලකා බලන ලද ලේඛන කාරක සභා වාර්තා, කාරක සභාවේ ලේකම් විසින් සුරක්ෂිතව පවත්වා ගත යුතුය.

13. (1) මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභාවක පත්කළ සාමාජිකයෙකු අනුගාමී කාරක සභාරැස්වීම් වාර තුනක් සඳහා කාරක සභාවේ අවසරයකින් තොරව නොපැමිණියේ නම් එම කාරක සභා සාමාජිකයාගේ විශේෂ උපදේශක කාරක සභා සාමාජිකත්වය එනයින්ම අවසන් වන්නේය.

(2) කාරක සභාවේ ඇතිවන පුරප්පාඩුවක් සඳහා වෙනත් සාමාජිකයෙකු පත්කළ යුතු අතර එසේ පත් කිරීමේ දී මෙම නියමය යටතේ සඳහන් සංයුතිය අදාළ විය යුතුය.

(3) කාරක සභාවකහිස් වූ පුරප්පාඩුවක් සඳහා සාමාජිකයෙකු පත්කිරීමේ දී, එසේ පත්කරන ලද සාමාජිකයාගේ ධූර කාලය, එම කාරක සභාවට අදාළ ධූරය හිස් වූ සාමාජිකයාගේ ඉතිරි ධූර කාලය විය යුතුය.

14. මෙම නියමය යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභාවක් විසින්,

(1) කාරක සභාව ඉදිරියේ ඇති කරුණක් සම්බන්ධයෙන් මහා නගර සභාවෙහි කිසියම් සභිකයෙකු හෝ නිලධාරියෙකු විසින් තම අදහස් ඉදිරිපත් කිරීම යථායෝග්‍ය යැයි අදහස් කරන කවර අවස්ථාවක හෝ ඊට අදාළව අදහස් ලිඛිතව හෝ වාචිකව කාරක සභාව අදහස් කරන පරිදි ඉදිරිපත් කළ හැකිය.

(2) කාරක සභාව ඉදිරියේ ඇති කරුණක් සම්බන්ධයෙන් මහජන අදහස් විමසීම උචිත යැයි කාරක සභාව අදහස් කරයි නම්, කරුණට අදාළව අවසන් උපදෙස් කමිටුවට ඉදිරිපත් කිරීමට පූර්වයෙන් කාරක සභාව විසින් මහජන අදහස් විමසීම සඳහා ක්‍රියා කළ හැකිය.

15. සෑම මසකම මෙම නියම යටතේ පත්වන විශේෂ උපදේශක කාරක සභා යටතේ සලකා බලන ලදුව මහා නගර සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන නිර්දේශයන්ට අදාළ යෝජනා, එම කාරක සභාවේ සභාපති විසින් අනුගාමී මාසයේ සාමාන්‍ය මහා සභා රැස්වීමට හෝ විශේෂ මහා සභා රැස්වීමකට මහා නගර සභාවට තීරණය කිරීම සඳහා යෝජනා කළ යුතුය.

16. කාරක සභාවක කටයුතු සිංහලෙන් හෝ දෙමළ භාෂාවෙන් විය යුතු අතර, කටයුතු සිදුවන භාෂාවට අනුකූලව වාර්තාව පිළියෙල කළ යුතුය. සිංහල මාධ්‍යයෙන් පිළියෙල කරන ලද කාරක සභා වාර්තාවක් දෙමළ මාධ්‍යයෙන් ද, දෙමළ මාධ්‍යයෙන් පිළියෙල කරන වාර්තාවක් සිංහල මාධ්‍යයෙන් ද, කවර පාර්ශවයකට ලබා ගැනීමේ අයිතිය ඇත්තේය.

17. මෙම නියමයෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා අතර, අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

EOG 03 - 0364/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.